ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

<u>පුවත්පත් නිවේදනය</u>

ඉන්දියානු සංචිත බැංකුව ඇමරිකානු ඩොලර් මිලියන 400 ක විනිමය හුවමාරු පහසුකමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දීමට අවශ්‍ය කෙරෙන ලියකියවිලි සඳහා අත්සන් තබන ලදී. මෙම විනිමය හුවමාරු පහසුකම 2022 නොවැම්බර් දක්වා හිමි වනු ඇත.

2. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මෙම තොරතුරු ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට දැනුම් දී ඇත . 2020 ජූලි 14 වන දින නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා ශ්‍රී ලංකා මහ බැංකු අධිපති මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා හමුවී විනිමය හුවමාරු පහසුකම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

3. මහ කොමසාරිස් කාර්යාලය අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන සියලු කරුණු පිළිබඳව ශ්‍රී ලංකාව සමඟ ඵලදායි ද්විපාර්ශවික සහයෝගීතාවයක් සඳහා සමීපව කටයුතු කර ඇත. 2020 ජූලි 22 වන දින මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාවේ ද්විපාර්ශවික ණය ආපසු ගෙවීම් ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව ඵලදායි තාක්ෂණික සාකච්ඡාවන් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබුණි.

4. කොවිඩ්-19 වසංගතයෙන් මතු වන අභියෝගයන්ට මුහුණ දීම සඳහා එක්ව කටයුතු කිරීමට සහ ආර්ථික ක්ෂේත්‍රය ඇතුළු අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි ඉන්දියා - ශ්‍රී ලංකා සහයෝගීතාවය වඩා ශක්තිමත් කිරීමට නායකත්ව මට්ටමෙන් දක්වන කැපවීම සක්‍රීය අයුරින් ක්‍රියාවට නැංවීම මෙවැනි ධනාත්මක පියවර වලින් පිළිඹිබු වේ.

*****

කොළඹ
ශක වර්ෂ 1942 ශ්‍රවන 3
2020 ජූලි 25